සැ. යු. - (i) 2021.06.11 වැනි දින අංක 2232 දරන ගැසට් පත්‍රයේ I : III, II, III සහ IV(ආ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2021 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,233 - 2021 ජුනි මස 18 වැනි සිකුරාදා - 2021.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1386 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජූලි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජුනි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර මාපනාවතුර පාරේ අංක 153, දරන ස්ථානයේ පදිංචි විදාන ආරච්චිගේ සීලවතී (ශ්‍රී ලංකා ජා. හැ. අ. 707061820 V) යන අයව මාගේ ඇටෝර්නි බලකාරිය ලෙස පත්කරනු ලැබූ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ගංගනාථ විසින් ලියා සහතික කරන ලද අංක 16822 සහ 2017.12.12 දින දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කළ බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය ශූන්‍ය හා බලරහිත හා නීතිය ඉදිරියේ බලාත්මක කළ නොහැකි ලේඛනයක් බවත්, දැනට මාලදිවයින් ජනරජයේ, අද්‍රන් රිසෝට්ස් 06 වන මහල, එච් තුනියා, බොඩුතකුරුෆානු මගු, මාලේ යන ස්ථානයේ පදිංචි කපිල හිරංජන් බණ්ඩාර හේරත් වන (ශ්‍රී ලංකා ජා. හැ. අ. 681901027 V සහ ගමන් බලපත්‍ර අංක N 5310095 දරන) මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනයාට මෙයින් දැනුම් දෙමි.

කපිල හිරංජන් බණ්ඩාර හේරත්,

2021 ජුනි මස 9 වැනි දින දී ය.

06-257

---

## ඩෂ්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය - පීවී 82748

**ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීමේ යෝජිතය**

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වන වගන්තියේ 02 වන උප වගන්තියට ප්‍රකාරව ඩෂ්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංකය පීවී 82748) සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීමේ යෝජිතය පිළිබඳ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වන වගන්තියට ප්‍රකාරව එකී සමාගමේ රුපියල් අසූඑක් මිලියන හැත්තෑදහස් පන්සියක (රු. 81,070,500) වටිනාකමකින් යුත් ප්‍රකාශිත ප්‍රාග්ධනය මගින් නිරූපණය කෙරෙන අට මිලියන එක් ලක්ෂ හත්දහස් පනහක සාමාන්‍ය කොටස් (8,107,500) රුපියල් මිලියන පනස් තුනක (රු. 53,000,000) ප්‍රකාශිත ප්‍රාග්ධනයක් දක්වා සහ පස් මිලියන තුන් ලක්ෂයක (5,300,000) සම්පූර්ණයෙන් ම ගෙවන සාමාන්‍ය කොටස් දක්වා අඩු කිරීමට එහි කොටස් හිමියන්ට නිර්දේශ කිරීම ඩෂ්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංකය පීවී 82748) සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් මෙම දැන්වීම මගින් දැනුම් දී ඇත. කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සමාගම් පනතේ 144 වන වගන්තිය අනුව කොටස් හිමියන්ගේ විශේෂ යෝජනාවක් 2021 අගෝස්තු 20 වැනි දින සම්මත වේ.

- ඩෂ්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංකය පීවී 82748) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල විසින් එකී සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම අනුමත කරමින් සම්මත කළ යෝජනා සම්මතය, 59 වන වගන්තිය යටතේ සලකනු ලබන ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීමේ යෝජනා සම්මතය පිටපත්, සමාගමේ යම් ණයහිමියකු හෝ සමාගම බැඳීමකින් යුතුව සිටින යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා, සමාගමේ ලේකම් චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කාර්යාලයේ, එනම් කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 141/3 දරන ස්ථානයෙහි සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී ලබාගත හැකි අතර එසේ නොමැති නම් පහත සඳහන් ඊමේල් ලිපිනයට විද්‍යුත්තැපැලක් යැවීමෙන් පරීක්ෂණය සඳහා බැඳීම් ලේඛන ලබා ගත හැකි ය.
(cbs@chart.lk)

ඩෂ්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි (පීවී 82748)

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 8954)
සමාගම් ලේකම්.

2021 ජුනි මස 03 වැනි දින දී ය.

06-279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.